# මොරටුව මහ නගර සභාව

## වරිපනම් ලේඛණයේ අයිතිකරුවන්ගේ නම ලියාපදිංචි කිරීම සඳහා අනුගමනය කලයුතු උපදෙස්

මො.ම.න.ස./වරි/01 ආකෘති පත්‍රය නිසි ලෙස සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතුවේ.

ඒ අනුව,

01. ඔබගේ අදාල ඔප්පුවේ මුල්පිටපත, එයට අදාල මානක සැලැස්මේ මුල්පිටපත සමඟ ඡායාස්ථ පිටපත් 1 බැගින් අනිවාර්යයෙන්ම ඉදිරිපත් කල යුතුය.
(ඡායාස්ථ පිටපත සහතික කර ගැනීමෙන් පසුව මුල් පිටපත ආපසු දෙනු ලැබේ.)

02. මොරටුව මහ නගර සභාවේ වරිපනම් ලේඛණයට අනුව අයිතිකරුගේ නම සහ ඔප්පුවේ සඳහන් දීමනාකරුගේ නම එකිනෙකට සමාන විය යුතුය. අයමාන නම් සම්බන්ධතාවය ඔප්පු අංක සහිතව නොතාරිස්වරයෙකු විසින් පිළියෙල කරන ලද පෙළපත් වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය. ලේඛණගත අයිතිය අයිතිකරු හෝ අයිතිකරු හිමිකම් කියයි, යනුවෙන් වරිපනම් ලේඛණයේ සඳහන් අවස්ථාවලදී අවුරුදු 25 ක් ඉඩමේ අයිතිය පිළිබඳ හිමිකම් වාර්තාවක් ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ.

03. දේපල සඳහා භාවිතා කරන වරිපනම් අංකය, පාරේ/වීථියේ නම හා අදාල කොට්ඨාශය නිවැරදිව යෙදීම. (මෙය අත්‍යවශ්‍යය)

04. ඉඩමකින් බෙදු වෙන්කල කොටසක් නම්, ඉඩමේ ප්‍රමාණය ගහකොළ ගොඩනැගිලි සමඟද නැද්ද විස්තර හා මායිම් නිවැරදිව සටහන් කිරීම.

05. ඉඩමකින් නොබෙදු කොටසක් නම්, ඉහත සඳහන් 4 ඡේදයේ විස්තර සමඟ මුල් ඉඩමෙන් කෙතරම් ප්‍රමාණයකින් ද යනවග සඳහන් කරන්න.

06. මෙම පෝරමය ඉදිපත් කරන අවස්ථාව දක්වා ඇති කාර්තුව දක්වාම හිඟ වරිපනම් බදු ඇත්නම් ගෙවා තිබිය යුතුයි.

07. දැනට අයිතිකරු/අයිතිකරුවන්ගේ නිවැරදි ලිපිනය සඳහන් කල යුතුය.

08. නොතාරිස්තැනගේ නිල මුද්‍රාව/අත්සන හා දිනය යෙදීම.

09. සියලුම සංශෝධන කපා හැරීම් හා එකතු කිරීම් සඳහා නොතාරිස්තැන විසින් කෙටි අත්සන යොදා සහතික කල යුතුය.